


# කුරුටු කලාවක්



"අපට ජාතික නැටුමක් නැද්ද ?" පින්සල ප්‍රශ්ණාර්ථයක් එච්චා පන්හිඳට.

"ඇයි එහෙම ඇහුවෙ ?" පන් ප්‍රශ්ණාර්ථය ආපහු යැව්වා පින්ට.

මතකද අපි ඉස්කෝලෙ යන කාලේ චිත්‍ර/ නැටුම්/ සංගීතය කියලා සෞන්දර්ය විෂයයන් කළා ?"

"ඔව්, ඔය කියන්නෙ නවසිය ගණන්වල. අර කාල සටහනේ "චි/නැ/සං" කියලා ලිව්වෙ."

"ඉතින් ඔය චිත්‍ර කලාවෙන් නිර්මාණය වුණ ජාතික කොඩියකුයි සංගිතයෙන් නිර්මාණය වුණ ජාතික ගීයකුයි තියෙන හන්දා ජාතික නැටුමකුත් හදා ගත්තොත් ?" පින් යෝජනා කළා.

"එක එක අය එක එක නැටුම් නටනවාටනම් වැඩිය හොඳයි තමා. ඒත් ඉතින් ජාතික වෘක්ෂය, ජාතික පුෂ්පය, ජාතික පක්ෂියා වගේ නම් කරලා විතරක් නම් මදි. වැදගත් වෙලාවට ප්‍රයෝජනයට ගන්න ඕන.

"ඇයි ජාතික ඇඳුම ? අමතකත් වෙන්න හදනවා. හැබැයි ඉතින් එතකොට බෞද්ධ කොඩිය වගේ අනික් දේවලුත් හදාගන්න වෙයි. ඒ අතින් නම් නිර්මාණයක් වෙලා තියෙන්නෙ චිත්‍ර අංසෙන් විතරයි නේද ?"

"ඔව් ඒ දවස්වල චිත්‍ර/ නැටුම්/ සංගීතෙ වුණාට දැන් ඒක කියවන්න වෙලා තියෙන්නේ ආපස්සට; සංගීතය/ නැටුම්/ චිත්‍ර කියලා" පින්ගෙ ඒ කතාවෙ නම් ඇත්තක් තියෙනවා.

"ඇයි එහෙම වුණේ" පන්ගෙන් තවත් ප්‍රශ්ණාර්ථයක්.

"මං හිතන්නෙ චිත්‍ර කියන්නෙ නිහඬ කලාවක් වුණ හන්දා චිත්‍ර ශිල්පය වගේම ශිල්පීන් පවා හුඟක් වෙලාවට නිහඬ අය." පින් උත්තර බඳින්න වුණා.

"අනික් හේතුව තමයි කාලයක් තිස්සේ ජනප්‍රියම වෙලා තිබුණ ගුවන් විදුලි මාධ්‍යයෙන් මේ කලාවට ඉඩක් දෙන්න විදියක් නොතිබුණ එක."

"ඒ වුණාට පත්තර වලින් ඒක කෙරුණානෙ. පස්සෙ කාලෙක රූපවාහිනියටත් නැතිවම බැරි වුණානේ." ඒ පන්.

ඉඳලා හිටලා මංජු ශ්‍රී, ජෝර්ජ් කීට් වගේ අයගේ දේවල් පළවුණා. පුංචි ඉඩක් ලැබුණා චිත්‍ර කතා වාගේ දේවල්වලටත් පස්සෙ චිත්‍ර කතා පත්තරත් එළියට ආවා. ඒ කාලයේ ජනප්‍රියම චිත්‍ර අංගය විදියට "චිත්‍ර කතාව" මුල් තැනට ආව එකත් ඇත්ත. ඒ වුණාට ඒ ජනප්‍රියම චිත්‍ර අංගයේ වුණත් මුලටම උන්නු බන්ධුල හරිස්චන්ද්‍ර, ජනක රත්නායක දයා රාජපක්ෂ වගේ ශිල්පීන්ගේ පින්තූරයක්වත් දැකපු අය ඉන්නෙ කී දෙනා ද? ඒ තරමටම නිහඬයි ඒ අය. වෙන එකක් ඕන නෑ. මේ මෙල්බර්න් වල අපි අතරෙ ඉන්න විජය කරුණාසේන උන්නැහෙ ජනප්‍රිය චිත්‍රකතා පත්තරවල කතා ඇඳපු කෙනෙක් කියලා දන්නේ කී දෙනා ද? හොඳ හඬකුයි හැකියාවකුයි තිබුණ හන්දයි උන්නැහේ ව එස්. බී. එස් එක හරහා අපේ අය හඳුනගත්තෙ."

"එහෙම නෙවෙයි; ඔය කලාව ගැන මොනවා හරි දෙයක් මේ වතාවේ සන්නසට ලිව්වනං නරකද ? පන් යෝජනා කළා.

මට හිතෙනවා අපේ අය ගණන් ගන්නෙ නැති කලාවේත් ගණන් ගන්නෙම නැති අංගයක් ගැන ලියන්න. හැබැයි ඉතින් හොඳ වෙලාවට මෙහෙ උදවිය ඔය මොනම දෙයක්වත් අත අරින්නෙ නැතිව හොයලා බලන, අගය කරන කට්ටියක් හන්දා ඔය ගැන පොත් පත් පවා බරට ලියැවිලා තියෙනවා." පින්ට ලියන භාෂාවෙන් ලියනවට වඩා කියන භාෂාවෙන් ලියන එක පහසුයි වගේ.

පොදු තැන්වලට මූණ දාලා තියෙන තාප්පවල, බිත්තිවල, උමංවල, පුවරුවල කුරුටු ගෑමේ කලාව, බලි ඇඳීමේ කලාව ලංකාවේත් තියෙනවා. මේ අසම්මත කලාව අවසරයෙන් කරනවාට වඩා කෙරෙන්නේ අනවසරයෙන්. අනවසරයෙන් කෙරෙන මේ කලාව නීති විරෝධී වගේම පොදු දේපළ විනාශ කරන කලාවක් වෙලා තියෙනවා. මේ රූප, අකුරු මකන්න මහජන මුදල් සෑහෙන්න වියදම් කරන්න වෙලා තියෙනවා."

මෙල්බර්න් වල පාරක් තොටක් ගානේ තියෙන මේ කලාවට ඉංග්‍රීසියෙන් කියන්නේ "ග්‍රැෆිටි" (GRAFFITI) කියලා. දවසක් කෝච්චියක මුල්ලකට වෙලා චිත්‍ර අඳින පොතක ග්‍රැෆිටි චිත්‍ර ඇඳ ඇඳ ගිය සුදු හාදයෙක් දැකලා මටත් හිතුනා ඔය ගැන පොතක් පතක් හොයලා කියවලා බලන්න. ඉතින් මට හමුබවුණා "ක්‍රිස්ටීන් ඩීව්" (CHRISTINE DEW) ගේ "අන්කොමිෂන්ඩ් ආර්ට්" (UNCOMMISSIONED ART) කියන පොත. ඒ පොතට හැඳින්වීමක් කරන මෙල්බර්න් විශ්ව විද්‍යාලයේ ආචාර්ය ලොක්ලන් මැක්ඩොවල් (LACHLAN MACDOWALL) ලියලා තියෙන්නෙ මේ කලාව පටන් ගත්තේ හැත්තෑව දශකය අගභාගයේදි කියලයි. කාශ්‍යප රජ්ජුවො සීගිරියේ ගල් බිත්තියේ චිත්‍ර ඇන්දෙව්වේ, කැටපත් පවුරේ ගීත කුරුටු ගාන්න ඉඩ දුන්නේ නම් මීට බොහොම කාලයකට උඩදි. ඒ ගැන අපි වතාවක් කතා කළානෙ ඉතින් ආචාර්යතුමා කියන හැටියට ඒ දවස්වලම රොනී එලිස් (RENNIE ELLIS) කියන ඡායාරූප ශිල්පිනිය "ඔස්ට්‍රේලියන් ග්‍රැෆිටි" (AUSTRALIAN GRAFFITI) කියන පොත කළාලු. ඒත් ක්‍රිස්ටීන් එයාගේ පොතේ කියලා තියෙන්නේ ඒකට ඉයන් ටර්නර්ත් (IAN TURNER) හවුල් වුණාය කියලා. ඒ 1975 දී කොහොම වුණත් ක්‍රිස්ටීන්ගේ "අන් කොමිෂන්ඩ් ආර්ට්" පොත ප්‍රකාශයට පත් කෙරුණෙ 2007 දී. මේ වගේ ගැෆිටි ගැන පින්තූර එකතු කරලා ලියවුණ පොත් තවත් ඕන තරම් ඇති. මට හම්බ වුණ තවත් පොතක් තමයි කෙට් (KET) ගේ ග්‍රැෆිටි පින්තූර එකතු කරපු "ග්‍රැෆිටි ප්ලැනට්" (GRAFFITI PLANET). 2006 දී ප්‍රකාශයට පත්වුණ ඒ පොතේ මුළු ලෝකයේ ම ඇති ග්‍රැෆිටි එකතුවක් තියෙනවා. තේම්ස් සහ හඩ්සන් ප්‍රකාශකයින්ගේ ෆ්‍රේයිට් ටේන් ගැෆ්‍රිටි (FREIGHT TRAIN GRAFFITI) පොත 2006 දී එළි දැක්වුණ තවත් ග්‍රැෆිටි එකතුවක්.

ක්‍රිස්ටීන් කියන හැටියට "ග්‍රැෆිටි" (GRAFFITI) කියන වචනය හැදිලා තියෙන්නේ "ගැෆියෝ (GRAFFIO) කියන ඉතාලි භාෂාවේ වචනයෙන්. ඒ කේ තේරුම "සූරන ලද" (SCRATCH) නැත්තම් "කුරුටු ගාපු " කියන එකයි. තියුණු දේකින් මතුපිටක සූරපු බලි පින්තූර, නම් වගේ දේවල්වලින් තමයි මේ කලාව පටන් අරගෙන තියෙන්නේ. ඒ නිසා ගැෆිටි කලාවට යතුරකින් ජනෙල් උළුවස්සක සූරපු බලි රූපයක ඉඳන් පාට කරන විශාල රෝලර් වලින් බිත්තිවල පාට කරපු විශාල රූප වෙනකල් නිර්මාණ අයිති වෙනවා.

පසුගිය දශකයේදී සෑහෙන දුරක වර්ධනයක් මේ කලාව ලබලා තියෙනවා. ඒ නිසාම වෘත්තිමය තත්වයයේ ග්‍රැෆිටි කලාකරුවන් බිහිවෙනවා. ඒ පිළිබඳව පාඨමාලාවල් තියෙනවලු. මං හිතන්නෙ මට අර කෝච්චියෙදි හම්බවුණොත් ඒ වාගේ ඉගෙන ගන්න හාදයෙක් වෙන්න ඇති. මේ ප්‍රවණතාව "වීදි කලාව" (STREET ART) කියන ක්ෂේත්‍රය පුරාම දකින්න ලැබෙන දෙයක්. "ස්ටෙන්සිල් ග්‍රැෆිටි" (STENCIL GRAFFITI) ස්ටිකර්ස් (STICKERS) අලවන පින්තූර, (PASTE UPS) ත්‍රිමාණ නිර්මාණ (SCULPTURES), කඩදාසි වල හරි ලීවල හරි ලෝහවල හරි කරපු චිත්‍ර නිර්මාණ වීදී කලා අංග කියලයි හඳුන්වන්නෙ.

මුල්ම වකවානුවේ නිව්යෝක් නගරයේ දුම්රිය උමංවල ඇඳපු "හිප් - හොප්" රටාවේ ග්‍රැෆිටි විවාදාත්මක කලාවක් වුණා. අසුන්දර තැන් සුන්දර කරන්න රළු මතුපිටවල්වල අපහසුවෙන් ඇඳපු මේ චිත්‍ර වර්ණවත් හරි, කළු හරි රේඛා චිත්‍ර විදියටත් අඳිනවා. සමහර විට ඒවා චිත්‍ර විතරයි. සමහර වෙලාවට අකුරු විතරයි. තවත් වෙලාවට ඒ දෙකම. අකුරු අඳිනකොට අකුරෙ සීමාව අඳින පිට රේඛා එක පාටකින් ඇඳලා තව පාටකින් මැද පුරවනවා. සමහර වෙලාවට මැද පුරවන්නෙ නැතිව පිට රේඛාව විතරක් තියෙනවා. තවත් ඒවායේ ත්‍රිමාණ ගතිය පෙන්වන්න එළිය අඳුරත් පාටකරනවා. මේ අකුරු බොහෝමයක් ම පැතිරී ගිය, විශාල ගෝලාකාර අකුරු. මේවායින් තමන්ගේ හිතේ තියෙන අදහස්, දේශපාලන අදහස්, නොයෙක් විදිහේ පාඨ පණිවිඩ කියවෙනවා.

මුලින් යතුරක් වැනි දේකින් සූරපු චිත්‍ර පස්සෙ "ෆෙල්ට් ටිප්" (FELT - TIP) පෑන් වලින් පාට විදින භාජන (SPRAY CAN) නැත්නම් "ස්ප්‍රේ කෑන්" වලින් අඳින්න ගත්තා. ඒ වැඩේට නිදහස්ව අඳින්න පුළුවන් කම (FREE HAND DRAWING) ඕන වෙනවා. චිත්‍රවලට සමහර විට ජනප්‍රිය කාටූන් චරිත හරි විකට චිත්‍ර හරි යොදාගත්තා. අච්චුවක් කපාගෙන ඒක තියලා පාට විදීම "ස්ටෙන්සිල් ග්‍රැෆිටි" කියලයි කියන්නෙ. (STENCIL GRAFFITI) කතා කරනකොට එන ශබ්දයට අපි කියමුකො "ෆො සේල්" (FOR SALE) කියලා ලියන්න ඕන කියලා. ඒක "4 සේල්" (4 SALE) කියලත් ලියන්න පුලුවන් මේ කලාවේ විදියට. එක එක ලාංඡන අඳින එකත් තව කොටසක්.

ග්‍රැෆිටි හොඳ පැත්තට හරවාගත්ත තැන් තියෙනවා. ඒ වෙනුවෙන් වෙනම ම පුවරු, තාප්ප, තැන් තියෙනවා. ලංකාවේ තාප්පවල පෝස්ටර් අලවන එක මඟ අරවාගන්න ඉස්කෝල ළමයින් ලවා චිත්‍ර අන්දවන්නත් හොඳම චිත්‍රවලට තෑගි දෙන්නත් තරඟ සංවිධානය වුණා. සමහර ඉස්කෝලවල තාප්ප ආදර්ශ පාඨ කවි වලින් සැරසුණා. රාජ-ගිරියේ ආයුර්වේදයේ තාප්පය හැඩවුණේ ළමයින්ගේ චිත්‍රවලින්. මහරගම බුවනෙකබා විද්‍යාලයේ තාප්පයේ එස්. මහින්ද හාමුදුරුවන්ගේ දේශාභිමානී කවි ලියවුණා. ග්‍රැෆිටි පසු බිමට යොදාගෙන ගීතයක් වෙනුවෙන් කරපු දර්ශන පෙළක් ගැනත් ලියන්න ඕන. ඒ අසුන්තා කරුණාරත්න ගායිකාවගේ "උනා දමා සළු ගමෙන් ගෙනා" සින්දුවට වරුණ සාවින්ද උන්නැහෙ කරපු දර්ශන පෙළය. සින්දුවේ අදහසට මෙල්බර්න් ග්‍රැෆිටි අගේට ගැලපුනා.

ග්‍රැෆිටි කලාව බොහොම වෙලාව මකන්න උත්සහ කරන කලාවක්. ඒ වෙනුවෙන්ම කැපවුණ ආයතන පවා දියුණු රටවල්වල තියෙනවා. ඒත් ආරක්ෂා කරගන්න දඟලන කලාවක් චිත්‍රකලාව. සීගිරි බිතුසිතුවම්, මොනාලිසා වගේ චිත්‍ර රැකගන්නයි මහජන මුදල් වැයවෙන්නෙ. හරි පුදුමයි නේද වෙනස?

චිත්‍ර කලාව පත්තර ලිපියක, පොතක කවරෙක, වේදිකා පසුබිමක උත්සවයක පින්තූර, දර්ශනවල අනික් සකල කලාවන් වෙනුවෙන් අලංකාරයත් අර්ථවත්බවත් වැඩි කරන්න නිහඬව කැපවෙලා ඉන්නවා.......!" පින් ලිව්වා.

"ඒ නිහඬබව හරිම ගැඹුරුයි; ඒ වගේම සුන්දරයි !" පන් කිව්වා.

සිසිර දිසානායක

STANHOPE PRINTING
FOR OFFSET AND DIGITAL PRINTING
සිඩ්නි සහ මෙල්බර්න් ශ්‍රී ලාංකිකයනට කදිම අවස්ථාවක්

- Labels
- School Magazines
- News Letters
- Business Stationery
- Annual Reports
- Special Publications
- Posteres
- Brochures
- Greeting Cards
- Business Cards
- Flyers
- Price Lists

ALL YOUR PRINTING NEEDS....

ඔබගේ සියලුම මුද්‍රණ කටයුතු සඳහා පහත සඳහන් අංකයනට අමතන්න

මුද්‍රණ ඇනවුම් සඳහා තැපැල් ගාස්තුවලට අයකිරීමක් නොමැත

LAKSHMAN
TEL.(02) 9626 7660
MOB.0405287243